**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 09 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.6,767,920 ක් වුවත් එම වටිනාකම රු.7,006,418 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු.238,498 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව ගිණුමේ ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වේ. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මසට අදාල උසාවි දඩ ආදායම සම්බන්ධව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවා ඇති උපලේඛනය 2019.04.10 වන දින ලද බැවින් අවසන් ගිණුම සඳහා උපලේඛන ලබා දෙන අවස්ථාවේ එම මුදල නිෂ්චිතව හදුනාගත නොහැකි විය. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක ණය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 19 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.1,448,083 ක් වුවද එදිනට ගිණුම් සමග | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කටයුතු කළයුතු වේ. | පිළිගනිමි<br>නිවැරදි ශේෂයන් ඇතුළත් කර ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි. |

ඉදිරිපත් කර ඇති උපලේඛනය අනුව එහි වටිනාකම රු.1,449,221ක් ලෙස දක්වා තිබීම නිසා රු.176,740 ක එකතු වෙනසක් විය.

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ව්‍යාපෘති 13 කට අදාළව වර්ෂ 02 ක් ඉක්මවූ ලැබිය යුතු මුදල රු.1,701,406 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මෙහි සඳහන් ව්‍යාපෘති 13 න් ව්‍යාපෘති 02 කට අදාල රු.297,585 ක මුදල් 2019 වර්ෂය තුලදී ලැබී ඇති අතර ඒ සඳහා ගෙවීම් සිදු කර ඇත.අනෙකුත් ව්‍යාපෘති වල තොරතුරු විමර්ශනය කර ඉදිරි වර්ෂයේ දී ගැලපීමට කටයුතු කරමි. |
| (ii) | වසර 02 ක් ඉක්මවූ ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.2,493,331 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමේ කටයුතු කළයුතු වේ. | රු.393,316 මුදල් 2019 වර්ෂය තුලදී ගෙවා අවසන් කර ඇත. ව්‍යාපෘති 2014 වර්ෂයේ සිදු කර ඇති අතර,ගෙවිය යුතු ලෙස සඳහන් වන මුදල් එම ව්‍යාපෘති වල අතරුදවුම් මුදල් වේ.ව්‍යාපෘති වල පැවති අඩු පාඩු නිසා අතරුදවුම් මුදල් ගෙවීම නිර්දේශ කර නොමැති ඉතිරි ව්‍යාපෘති 2017 වර්ෂයට අදාල වන අතර එම වටිනාකම් තැන්පත් ලෙජරයේ සටහන් කර ඇත. |

(ඈ). විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | අදහස් දැක්වීම් |
|---|---|---|
| වටිනාකම රු.147,113,677 ක් ගිණුම් විෂයයන් 04 කට අදාලව අයිතිය තහවුරු කිරීමේ ලිපි, වත්කම් ලේඛන, වයස් විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීමේ ලිපි සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය/ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | මෙම අඩුපාඩු ඉදිරි වර්ෂවලදී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------------

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක කාලය ඉක්මවූ රු.63,500 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කලයුතු වේ. | ඉකුත් තැන්පතු ආදායකයන්ගෙන් විමසා ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 12 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍ර ලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරි මාසය තුල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 අංක දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක මෘදුකාංග පිළිබඳ වෙනම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වේ. | පරිගණක මෘදුකාංග පිළිබඳව ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරමි. |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,269,619 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,790,265 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කල ආදායම | 2018 රැස්කල ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කල ආදායම | 2017 රැස්කල ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපාර හා කාර්ය බදු | 1,550,000 | 1,985,775 | 1,985,775 | - | 1,500,000 | 2,254,540 | 2,254,540 | - |
| කඩ කුලී | 426,700 | 387,000 | 316,315 | 70,685 | 387,000 | 387,000 | 305,315 | 81,685 |
| බලපත්‍ර ගාස්තු | 100,000 | 296,236 | 296,236 | - | 175,000 | 314,936 | 314,936 | - |
| වෙනත් ආදායම් (කිරික්කුලම බදු කුලී) | 3,600,000 | 3,600,000 | 3,000,000 | 600,000 | 3,600,000 | 3,600,000 | 3,300,000 | 300,000 |
| එකතුව | 5,676,700 | 6,269,011 | 5,598,326 | 670,685 | 5,662,000 | 6,556,476 | 6,174,791 | 381,685 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශවල පිහිටියා වූ යම් නිශ්චල දේපල හෝ චංචල දේපළ වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් පනවා අය කිරීමට කටයුතු කර නොතිබුණි. | දියුණු කල ප්‍රදේශ ගැසට්කර වරිපනම් අයකිරිමට කටයුතු කල යුතු වේ. | බල ප්‍රදේශයේ තෝරා ගත් ග්‍රාම නිළධාරි වසම් 6 ක් සඳහා වරිපනම් පැනවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇති අතර, ඒ යටතේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේ යෝජනාව සභා සම්මත වී ඇති අතර, ඒ අනුව වරිපනම් පැනවීමට අපේක්ෂිත ප්‍රදේශය සිතියම් ගත කර ඇත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 6,410,316 ක් හා මුද්දර ගාස්තු රු.38,823,037 ක් විය. | අදාල තහවුරු කිරිම් වාර්තා කඩිනමින් ලබාගෙන හිග මුදල් අයකිරිමට කටයුතු කල යුතු වේ | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ ජනනය වන කසල, කීරික්කුලම කසල ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානය වෙත බැහැර කර තිබුණි. ප්‍රදේශවාසීන් මෙම මධ්‍යස්ථානයට දක්වන විරෝධතාව මත මේවන විට මෙම ස්ථානයට කසල බැහැර කිරීමට නොහැකිවී තිබුණි. දැනට ප්‍රාදේශීය සභාව විසින් පෞද්ගලික ඉඩමකට බල ප්‍රදේශයේ ජනනයවන කැලිකසල බැහැර කරන බව අනාවරණය විය. | නියමයන් ප්‍රකාරව කසල බැහැර කිරිමේ, ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයක් ඇති කිරිමට පියවර ගැනීමක් කළ යුතු වේ | දැනට පුද්ගලික ඉඩමකට කසළ බැහැර කරන අතර කසළ බැහැර කිරීම සඳහා ඉඩමක් ලබා දෙන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තතුවට ඉල්ලීමක් කර ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් වී අදාල අරමුණ ,ඉලක්ක හා ඉදිරි කාර්යයන් ආරම්භ කිරිමට කටයුතු කලයුතු වේ. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් නඩත්තු කරනු ලබන පොදු තැන්පත් ලේඛනය යාවත් කාලීන කර නොතිබුණි. | තැන්පතු ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | පසුගිය වර්ෂ වල බඳු දී ඇති ස්ථාන සඳහා තැන්පත් ලෙස ඇති ශේෂ පිළිබඳ විමර්ෂණ කර ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව විසින් එකතු කරගනු ලබන මුද්දර ගාස්තු කාලීනව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.1,723,331 ක් දක්වා වර්ධනය වි තිබුණි. | අදාල මුද්දර ගාස්තු කඩිනම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරිමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ සිට කාර්තු වශයෙන් මුද්දර ගාස්තු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට දැනටමත් කටයුතු කර ඇති බව සඳහන් කරමි. පසුගිය වර්ෂ වලට අදාළ මුද්දර ගාස්තු ඉදිරියේ දී නිදහස් කිරීමට කටයුතු කරමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 46 ක් වන අතර , 2018 දෙසැම්බර් 31 දිනට ස්ථිර කාර්ය මණ්ඩලයේ 30 ක් සහ අනියම් කාර්ය මණ්ඩලය 16 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. | කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර සභාවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත.පුරප්පාඩුව සම්පූර්ණ කරන තුරු කනිෂ්ඨ සේවක සේවාවන් සඳහා පමණක් අනියම් කාර්ය මණ්ඩලය බඳවාගෙන ඇති බව දන්වා සිටිමි. |
| (ආ) | සභාවේ තනතුරු 8 ක සඳහා පුරප්පාඩු 17 ක් පැවතිණි. | කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කළයුතු වේ. | පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා සේවකයින් බඳවා ගැනීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. |
| (ඇ). | සභාවේ සේවයෙන් ඉවත් වී ඇති සේවකයන් 17 දෙනකුගේ රු. 88,605 ක ණය ශේෂයක් දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පැවතිණි. | හිග සේවක ණය අයකිරිමට කටයුතු කළ යුතු වේ. | දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින රු.88,605 ක ණය ශේෂය අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තක්සේරු වටිනාකම රු. 34,392,275 ක්වූ අක්කර 325 කට අධික ඉඩම් කැබලි 163 ක් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණද එම ඉඩම්වල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | ඉඩම් අයිතිය ලබා ගැනීමට කටයුතු කලයුතු වේ. | ඉඩම් වල අයිතිය පවරා දෙන ලෙස අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉල්ලීම් කර ඇති අතර මේ වන තෙක් ඉඩම් පවරා දීමට කටයුතු කර නැත. |

3.4.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු රු.1,319,050 ක් වටිනා මහේන්ද්‍රා ඩීසල් කැබ් රථය හා රු.541,000 ක් වටිනා සහල්පිටි බේකරි උපකරණ කට්ටල නිශ්කාර්යව පැවතුණි. | අදාල උපකරණ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරිමට කටයුතු කළයුතු වේ. | මෙම කැබ් රථය ධාවනයෙන් ඉවත් කිරීම අනුමැතියට යවා ඇත.සහල් පිටි බේකරිය ද අපහරණය කිරීමට කටයුතු කරමි. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(I) දරන මුදල් කළමණාකරන හා විගණන චක්‍රලේඛ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් කර ගනිමි. |